**2022 ජුලි මස 19 වන දින පැවති**

**පනස් එක්වන මහ සභා රැස්වීමේ කෙටුම්පත් වාර්තාව**

දිනය :-2022.07.19
ස්ථානය :- නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව
වේලාව :- පෙ.ව 10.00
සහභාගී වූ :-

| | | |
|---|---|---|
| 01. ගරු සභාපති | එස්.බී කුමාරදාස මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 02. ගරු උප සභාපති | එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 03. ගරු මන්ත්‍රී | බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරි මැතිනිය | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 04. ගරු මන්ත්‍රී | කේ.ඒ ශාන්ත මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 05. ගරු මන්ත්‍රී | කේ.ඒ සංජීව මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 06. ගරු මන්ත්‍රී | ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 07. ගරු මන්ත්‍රී | ජේ.ඒ ජයවර්ධන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 08. ගරු මන්ත්‍රී | පී.එස්.බී සිරිවර්ධන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 09. ගරු මන්ත්‍රී | එච්.ඩබ්.ජී.එන් කුමුදු වසන්ති මැතිනිය | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 10. ගරු මන්ත්‍රී | පී.ටී සිරිසේන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 11. ගරු මන්ත්‍රී | පී කරුණාරත්න මැතිතුමා | ( ශ්‍රී.ල නි.ප) |
| 12. ගරු මන්ත්‍රී | ඩී.පී බන්දුලසේන මැතිතුමා | ( ශ්‍රී.ල නි.ප) |
| 13. ගරු මන්ත්‍රී | ආර්.එම්.අයි ජනක ශ්‍රීමාලි මැතිනිය | ( එ.ජා.ප) |
| 14. ගරු මන්ත්‍රී | ආර්.එම් කුමාරසිංහ මැතිතුමා | ( එ.ජා.ප) |
| 15. ගරු මන්ත්‍රී | ඩී.එම්.එන් සුභාෂිණි බංඩාර මැතිනිය | ( එ.ජා.ප) |
| 16. ගරු මන්ත්‍රී | එස්.ඒ.කේ.පී ගුණවර්ධන මැතිතුමා | ( ජ.වි.පෙ) |
| 17. ගරු මන්ත්‍රී | වයි.එම් ගාමිණී බංඩාර මැතිතුමා(ස්වාධීන කණ්ඩායම) | |

දන්වා සහභාගී නොවූ:-

| | | |
|---|---|---|
| 18. ගරු මන්ත්‍රී | බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 19. ගරු මන්ත්‍රී | ජී.ඒ නෙළුම් මැතිනිය | ( එ.ජා.ප) |
| 20. ගරු මන්ත්‍රී | එම්.ඒ විමලසුරේන්ද්‍ර මැතිතුමා | ( එ.ජා.ප) |
| 21. ගරු මන්ත්‍රී | කේ. හැරිසෙන්ස් මැතිතුමා | ( ජ.වි.පෙ) |

නිළධාරීන්:-

| | |
|---|---|
| 01. ලේකම් | බී.එච් ප්‍රදීප් නිශාන්ත මයා |
| 02. විෂය භාර කළමණාකරන සේවා නිළධාරී | කේ.ජී.ඒ සම්මානි මෙය |

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන්ලා වෙත සුභ උදෑසනක් ප්‍රාර්ථනය කරමින්, ඉතාම ආදරයෙන් ගෞරවයෙන් පිළිගනිමින් න්‍යායපත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

**අ) මහ සභා වාර්ථාව සභා සම්මත කර ගැනීම.**

2022.06.17 වන දින මහ සභා කෙටුම්පත් වාර්ථාව

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2022.06.17 දින පැවැත් වූ මහ සභා රැස්වීමේ කෙටුම්පත් වාර්තාව ප්‍රාදේශීය සභා රීතීන්ට අනුව ඔබ වෙත ලැබීමට සළස්වා ඇති බැවින් එම වාර්ථාවේ අඩුපාඩු ඇත්නම්

සංශෝධනයන්ට යටත්ව සහා සම්මත කර ගන්නා ලෙස ප්‍රකාශ කරමින් 2022.06.17 මහ සභා කෙටුම්පත් රැස්වීම් වාර්ථාව සංශෝධනයන්ට යටත්ව සහා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී ජේ.ඒ ජයවර්ධන මැතිතුමා 2022.06.17 දින පැවති මහ සභාවේ කෙටුම්පත් වාර්ථාව සංශෝධන යන්ට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව කෙටුම්පත් වාර්තාව සම්බන්ධයෙන් සංශෝධන කිසිවක් ඉදිරිපත් නොවූ අතර 2022.06.17 වන දින මහ සභා රැස්වීම් කෙටුම්පත් වාර්ථාව සංශෝධන රහිතව සභා සම්මත විය.

**අ) සභාපතිතුමන් විසින් කරනු ලබන විශේෂ නිවේදනය.**

නැත.

**ආ) ප්‍රාදේශීය සභාව වෙත අමතා එවන ලද සංදේශ පෙත්සම්, පැමිණිලි සහ සන්නිවේදන**

ඇළ ඉවුරේ ඛාදනය වැළැක්වීමට බැම්මක් ස්ථාපනය කිරීම

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා අනුරාධපුර විජයපුර පණ්ඩුකාභය මාවතේ දෙවන පටුමග පදිංචිකරුවන් විසින් මෙය ඉල්ලා සිටී. ඇල මාර්ගයේ එක් පසක තිබෙන ඇළෙහි ඉවුර සෝදාපාළුවට ලක් වන බැවින් එම පටු මාර්ගයේ ගමනාගමනය මේ වන විට අදාළ වී ඇති බවත් තවදුරටත් මෙලෙස සෝදාපාළුවට ලක් වුවහොත් එම මාර්ගයේ ගමන් කිරීමට නොහැකි බවත්, මේ සඳහා පවුරු බැම්මක් බැඳීම යෝග්‍ය බවත්, ඒ පිළිබඳව නැනුප ප්‍රාදේශීය සභාවේ සභාපති තුමන්ගේ හා තාක්ෂණ නිළධාරිතුමන්ගෙ දැනුවත් කිරීම මත අප ප්‍රාදේශීය සභා මන්ත්‍රී කුමුදුනි බස්නායක මන්ත්‍රී තුමිය මගින් මෙලෙස දන්වා සිටින බව ප්‍රකාශ කරන ලදී. මෙම ඇළ මාර්ගය සඳහා ඉවුර සේදී යෑම වැළැක්වීමට පවුරු බැම්මත් බැම්මක් බැඳීම යෝග්‍ය බවට යෝජනා කරන ලදී .

ගරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරි මැතිනිය පණ්ඩුකාභය මාවතේ මෙම ඇළ ඉවුර ඛාදනය වීමේ ගැටලුව ඉතා දීර්ඝ කාලීන ගැටලුවක් බවත්, මෙම ජනතාව මෙයින් බොහෝ පීඩාවට ලක්වන නිසාත් ඇළ ඉවුර ඛාදනය වැළැක්වීම සඳහා බැම්මක් ඉදි කිරීමේ යෝජනාව ස්ථිර කරන ලදී.

**ඇ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ**

නැත.

**ඇ) යථා පරිදී කල් දී ඇති යෝජනා**

**01.** 2022 අගෝස්තු මස සේවකයින්ගේ අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීම.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2022 අගෝස්තු මසට අදාලව කාර්යය මණ්ඩලය විසින් අතිකාල ඉල්ලීම් කර ඇති අතිකාල තක්සේරු වාර්ථා සභාවට ඉදිරිපත් කරමින් අදාල සේවකයින් වෙත අතිකාල තක්සේරු වාර්තා අනුමත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

| 2022 අගෝස්තු | | පැය ගණන |
|---|---|---|
| 01. ඩබ්.එස්.එස්.එස්.පෙරේරා | (රියදුරු) | 75 |
| 02. ඩී.ඒම්. ගුණරත්න බංඩා | (මුරකරු) | 75 |

ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා 2022 අප්‍රේල් මසට අදාල අතිකාල ඉල්ලුම් කර ඇති සේවකයින්ගේ අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපති තුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා අතිකාල තක්සේරු වාර්තා අනුමත කිරීමේ යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතීද යන්න විමසූ අතර කිසිදු විරෝධතාවයක් ඉදිරිපත් නොවූ බැවින් 2022 අප්‍රේල් මස අතිකාල ඉල්ලුම්කල සේවකයින් වෙත අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීමේ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**02. කියවීමේ මාසයෙ වැඩසටහන ක්‍රියාත්මක කිරීම**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2022 ඔක්තෝම්බර් මාසයේදී නැනුප ප්‍රාදේශීය සභාවට අයත් ප්‍රාදේශීය සභා පුස්තකාලය, 9 ඇල පුස්තකාලය, නෙළුබැව පුස්තකාලය යන පුස්තකාල සඳහා ජාතික කියවීමේ මාසයට අදාලව වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබාගැනීමට මෙම ලිපිය ඉදිරිපත් කරන ලදි. ක්‍රියාත්මක කිරීම සඳහා බලාපොරොත්තු වන වැඩසටහන් පහත දක්වා ඇත.

- පොත පත කියවා ජීවිතය ජයගත් පුද්ගලයින්ගේ චරිතාපදාන පුස්තකාල එකතුවකට අත්පත් කර ගැනීමට කටයුතු කිරීම සහ විශේෂිත ක්‍රමයක් යටතේ සංවිධානය කර වර්ෂය පුරා ප්‍රචාරණය කිරීම සහ ප්‍රදර්ශනය කිරීම.
- පර්යේෂකයන් පාසල් සිසුන් සහ තොරතුරු සොයා එන ප්‍රදේශවාසීන්ගෙ අවශ්‍යතා සඳහා තොරතුරු කරා ප්‍රවේශ වීමට අවශ්‍ය පහසුකම් සැපයීම සහ සහය වීම.
- පළාත් පාලන බල ප්‍රදේශයට අයත් සෑම නිවසකම පුස්තකාලයක් යන සංකල්පය තේමා කොටගෙන ගෘහස්ථ පුස්තකාල ආරම්භ කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ගෘහ පරිභෝජනය සඳහා සුදුසු වන බෝග සහ ශාක වර්ග පිළිබඳව මෙන්ම ආර්ථික බෝග වගා කිරීම පිළිබඳ දැනුවත් කිරීම එම බෝග වගා කිරීම පිළිබඳ අවශ්‍ය තොරතුරු බෙදාහැරීම සඳහා වන වැඩසටහන් සිදු කිරීම.
- පාඨක සමාජයේ සෑම පාඨකයෙකුගේ ම නිවාස ආශ්‍රිතව ගෙවතු වගා කටයුතු සිදු කිරීමට පෙළඹවීම
- පාඨක නිර්මාණ ශීලී නිර්මාණශීලීත්වය එළිදැක්වෙන නිර්මාණ ඇතුළත් සගරා බිත්ති පුවත්පත් එළිදැක්වීම
- තේමාවට අදාළ ව පෝස්ටර් නිර්මාණය
- නව සාමාජිකයින් බඳවා ගැනීම හා නොමිලයේ පුස්තකාල සාමාජිකත්වය පිරිනැමීම
- තේමාවට අදාළ විවිධ තරඟ සංවිධානය කිරීම ( චිත්‍ර රචනා කථික )

මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරි මැතිනිය කියවීමේ මාසයට අදාලව අපගේ පුස්තකාල ආශ්‍රයෙන් සිදු කරනු ලබන මෙම වැඩසටහන් සෑම වර්ෂයක් පාසාම වාර්ෂිකව සිදුකරන නිසාත් මෙය දරුවන්ගේ කටයුත්තක් නිසාත් කියවීමේ මාසයට අදාලව අදාලව සිදු කරනු ලබන එම වැඩසටහන් සිදුකිරීමේ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් කියවීමේ මාසයෙ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

### 03. භාවිතය අවසන් ටයර් නැවත පිරවීම සඳහා අනුමැතිය ලබාගැනීම

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති තුමාගේ නිල රථය හැර අනෙකුත් වාහන වාහනවලින් පාවිච්චි කිරිමට නොහැකි ව ඉවත් කර ඇති ටයර් මෙය වන තුරු වෙන්දේසි කිරීමට හෝ අපහරණය කිරීම සිදු කර ඇති බවත් , නමුත් දැනට රටේ පවතින ටයර් හිගය හා අධික මිල පදනම් කරගෙන මෙම ටයර් නැවත පුරවා පාවිච්චි කිරීම සඳහා යොදාගත යුතු බවට යෝජනා කරන ලදී.

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා ගරු සභාපතිතුමා විසින් ගෙන ආ භාවිතය අවසන් ටයර් නැවත පිරවීම සඳහා අනුමැතිය ලබාගැනීමේ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් භාවිතය අවසන් ටයර් නැවත පිරවීම සඳහා අනුමැතිය ලබාගැනීමේ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

### 04. ආදායම් උත්පාදිත සෝලා පැනල් සවිකිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා මේ වන විට රට තුළ පවතින විදුලි අර්බුදය පදනම් කර ගනිමින් ඒ සඳහා ව්‍යාපෘතියක් ලෙසත් ප්‍රාදේශීය සභාවේ ආදායම් වැඩිකර ගැනීමේ ව්‍යාපෘතියක් ලෙසත් මෙම ආදායම් උත්පාදිත සෝලා පැනල් සවි කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදහස් කරන බවත් මේ සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් යොමු කරන ලද අංක PL/ 03/01/03 හා 2022.05.30 දිනැති ලිපිය 2022/ 06/17 මහා සභාවට ඉදිරිපත් කරන ලදී. මේ සම්බන්ධයෙන් දේශීය සංවර්ධන ණය අරමුදලෙ අධ්‍යක්ෂක තුමන් සමඟ පැවැත් වූ දුරකථන සාකච්ඡාවට අනුව දේශීය සංවර්ධන ණය අරමුදල මගින් ඇස්තමේන්තුගත මුදලින් 80% ක මුදලක් ණය වශයෙන් ලබා දිය හැකි බවත් ඉතිරි 20% ක මුදල ප්‍රාදේශීය සභා අරමුදලින් ගෙවිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

මෙම කරුණු සැලකිල්ලට ගෙන නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවට අයත් හිස් ඉඩම් තෝරා ගෙන මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදහස් කර ඇති අතර ඊට අදාළ සියලු තොරතුරු ඇතුළත් ව්‍යාපෘති වාර්තාවක් ලබන මහා සභාවට ඉදිරිපත් කරන බවත් ඉදිරියේදී දේශීය ණය සංවර්ධන අරමුදල මගින් අනුමත කරනු ලබන ණය මුදලට අනුව විවෘත ප්‍රසම්පාදන ක්‍රියාවලියක් මගින් මිල මිලගණන් කැඳවා සුදුසු මිල ගනන් තෝරාගැනීමෙන් අනතුරුව ක්‍රියාත්මක කිරීමට අදහස් කරන බැවින් අද දින පවත්වනු ලබන මහ සභාවේ එකගතාවය ලබා දෙන ලෙස මෙයින් යෝජනා කරන ලදි.

සෝලා පැනල් සවි කිරීමට බලාපොරොත්තු වන සභාව සතු භූමි

- 5 ඇල නිදංගල මාර්ගයේ පිහිටි ඉඩම
- පාලාඩි කුලම පිහිටි
- ජයබිම උත්සව ශාලාව
- තරියන්කුලම කොම්පෝස්ට් ව්‍යාපෘතියට වෙන් කරන ලද ඉඩම
- අභයපුර ඉඩම
- විභූතිගම ඉඩම
- ප්‍රාදේශීය සභා කාර්යාල භූමිය

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා මෙම සෝලා පැනල් සවිකිරීමේ සවි කිරීමේ ව්‍යාපෘතිය සඳහා වැය වන මුළු පිරිවැය කොපමණද? යනුවෙන් විමසන ලදී. තවද මෙම තෝරාගත් ස්ථානවල ගැටලු පවතින බවත් ප්‍රාදේශීය සභාවට අයත් මෙම පොදුභූමි වෙන්කර පවතින්නේ වෙනත් අරමුණක පොදු කටයුතු සඳහා බවත්, එම හිස් ඉඩම් වල සෝලා පැනල් සවිකිරීමට ගැනීමෙන් එම ඉඩමේ නියම අරමුණ සඳහා ගැටලුවක් ඇති වන බවත්, හිස් ඉඩම් වල භූමිය මත මෙම සෝලා සවි කිරීම මගින් වන සතුන්ගෙන් පවා හානි සිදුවී එම සෝලා විනාශ වීමට ඉඩකඩ පවතින බවත්, එම නිසා මෙම සෝලා සවිකිරීමට වහලවල් යොදාගැනීමට හැකියාව ඇති බවත් ඒ සඳහා ජයබිම උත්සව ශාලාවේ වහලය, නෙළුබැව සෞඛ්‍ය සායන මධ්‍යස්ථානය වහලය හා නෙලුබැව උප කාර්‍යාල වහලය වැනි ස්තාන යොදාගත හැකි බවත් ප්‍රකාශ කරන ලදී. වර්තමානයේ රටේ පොලී අනුපාතය මත මෙම ලබා ගන්නා ණය මුදල සඳහාද වැඩි පොලී අනුපාතයක් පවතින්නේ ද යන්න සොයා බැලිය යුතු බවත්, තවත් ඉදිරි වසර දහයක් ණය වුවහොත් සභා අරමුදල සඳහා එය බලපාන බවත් , මෙම සෝලා ව්‍යාපෘතිය මගින් සාර්ථක ලෙස ආදායම් උත්පාදනය කිරීමට හැකිද යන්න පිළිබඳව ගැටලු සහගත බවත් එම නිසා මේ පිළිබඳව සොයා බැලිය යුතු බවත් මේ සඳහා ව්‍යාපෘති වාර්තාවක් අවශ්‍ය බවත් ඒ අනුව මෙම යෝජනාව ස්ථිර කරන බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී පී.එස්.බී සිරිවර්ධන මැතිතුමා මෙමා ව්‍යාපෘතිය ඉතා හොඳ ව්‍යාපෘතියක් බවත් මෙහි භූමිය පිළිබඳව ගැටලුවෙදී ප්‍රාදේශීය සභාව සතුව පවතින කීරික්කුලම පිහිටි භූමි ප්‍රදේශයෙන් අක්කර දෙකක් පමණ නිදහස් කර මෙම ව්‍යාපෘතිය සිදු කිරීමට හැකි බවත් පැවසීය.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා දේශීය ණය සංවර්ධන අරමුදල මගින් ලබාදෙන ණය මුදල සඳහා වන පොලී අනුපාතය වැඩි අගයක් නොගන්නා බවත්, මෙම සෝලා ව්‍යාපෘතිය මගින් ආදායමක් උත්පාදනය වන නිසා පාඩුවක් සිදු නොවන බවත් මෙම ව්‍යාපෘතිය පිළිබඳව ව්‍යාපෘති වාර්තාවක් කඩිනමින් මහා සභාවට ඉදිරිපත් කරන බවත්, එම කීරික්කුලම භූමිය යොදා ගැනීම ඉතා හොඳ යෝජනාවක් බවත් ප්‍රකාශ කරන ලදී. ඒ අනුව ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් ආදායම් උත්පාදිත සෝලා පැනල් සවිකිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ,යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**05. පොතානේගම ශ්‍රී විජයාරාම විහාරස්ථානයේ වැට ඉදි කිරීමට කම්බි කණු සහ කටු කම්බි ලබා ගැනීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා නව යෝජනාවක් යටතේ පොතානේගම ශ්‍රී විජයාරාම විහාරස්ථානය වටා කම්බි වැට විනාශ වී එක් පසෙක කම්බි වැට නොමැතිකම නිසා එම විහාරස්ථානයේ දහම් පාසල් දරුවන්ගේ ආරක්ෂාව පිළිබඳව ගැටලු පවතින බැවින් ,කම්බි වැට ඉදිකිරීම සඳහා දායක සභාව සතුව මුදල් සහ දානපතියන් නොමැති කම නිසාත්, මෙම කම්බි වැට ඉදිකිරීමට අවශ්‍ය කම්බි කණු 15 ක් සහ කටු කම්බි 25 km ක් පමණ ලබා දීමට අවශ්‍ය කටයුතු කර දෙන මෙන් යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා මෙම විහාරස්ථානයේ වැට විනාශ වී ඇති නිසා විහාරස්ථානයේ භාණ්ඩ සහ දහම් පාසල් දරුවන්ගේ ආරක්ෂාව පිළිබඳව විශාල ගැටළුවක් පවතින බවත්, පසුගිය දිනෙක මෙම භූමියේ කුඩු කාරයින් ගැවසී ඇති බව,දැන ගැනීමට ලැබුණු බවත් ළමයින්ගේ ආරක්ෂාව සඳහා අවධානමක් පවතින බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා ගරු සභාපතිතුමා විසින් ගෙන ආ පොතානේගම ශ්‍රී විජයාරාම විහාරස්ථානයේ වැට ඉදි කිරීමට කම්බි කණු සහ කටු කම්බි ලබා ගැනීමේ යෝජනාව ස්ථිර කරන ලදී.

ඊ) කාරක සභාවල වාර්තා

- 2022 ජූලි මස 08 වන දින මුදල් කමිටු වාර්ථාව

සභා ගත කරන ලදී.

**එ) ලැබීම් ගෙවීම් මාසික වාර්තා**

2022 ජූනි මස ආදායම් හා වියදම් වාර්ථා මහ සභාවේ සලකා බැලීම සිදු කරන ලදී.

**ඒ) රැස්වීම් කැඳවීමේ දැන්වීම් හා වෙනත් කාරණා ඉදිරිපත් කිරීම.**

01. නිවාඩු දැනුම් දීම.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ගරු මන්ත්‍රී බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා, ගරු මන්ත්‍රී ජී.ඒ නෙළුම් මැතිනිය,ගරු මන්ත්‍රී එම්.ඒ විමලසුරේන්ද්‍ර මැතිතුමා, ගරු මන්ත්‍රී කේ. හැරිසෙන්ස් මැතිතුමා, මහ සභාවට නොපැමිණෙන බවට දන්වා යොමු කර තිබූ නිවාඩු ඉල්ලීම් මහ සභාවට ඉදිරිපත් කරන ලදී.

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා අදාල නිවාඩු ඉල්ලුම් කර ඇති ගරු සභිකවරුන් වෙත නිවාඩු ලබා දීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරි මැතිනිය ධර්මරාජ මාවතේ නිවසක ස්ලැබ් එකක් අනෙක් ඉඩම ප්‍රදේශයට වන්නට දමා ඇති බවත්, මෙය ප්‍රාදේශීය සභාවට දැන්වීමෙන් අනතුරුව තාක්ෂණ නිලධාරීන් මෙය පරීක්ෂාකිරීමට ගියත් මේ වන තෙක් ඒ සඳහා විසඳුමක් ලැබී නොමැති අතර එම නිවෙස් හිමියන් අතර ගැටුමක් ද වර්ධනය වී පවතින බවත් මේ සඳහා විසඳුමක් ලබා දෙන ලෙසත් ඉල්ලා සිටින ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා මෙවැනි ගැටළුවක් පිළිබඳව සාකච්ඡා කිරීමේදී තාක්ෂණ නිලධාරී තුමන් මහා සභාවට ගෙන් විය යුතු නිසාත්, මහා සභාව කාරක සභාවක් බවට පත් කිරීමට යෝජනා කරන ලදී.

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා මහා සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව සථිර කරන ලදි.

ලේකම් බී.එච් ප්‍රදීප් නිශාන්ත මයා ඉඩම් වල නිරවද්‍යාතාවය බැලිමට යෑමේදි, මිනින්දෝරු ගල් ජ්ලෑන් එකේ තිබුනත්, භූමියේදි එය වෙන්ස් කිරීම සොයා ගත නොහැකි බවත් ඒ අතරතුර මෙම ගැටලු ඇති වන බවත් ප්‍රකාශ කරන ලදි. එහිදී මිනින්දෝරුවන් යොදවා නිවැරැදිව මැන මෙයට විසඳුමක් දිය යුතු බවත් පැවසීය.

ගරු මන්ත්‍රී ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා කාරක සභාව මහ සභාවක් බවට පත් කිරීමට යෝජනා කරන ලදී

ගරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරි මැතිනිය කාරක සභාව මහ සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා නැවත මේ පිළිබඳව ශේත්‍රයට ම ගොස් පරික්ෂා කර බලා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව මහ සභාවට දැන්විය.

ගරු මන්ත්‍රී එස්.ඒ.කේ.පී ගුණවර්ධන මැතිතුමා මහජන නියෝජිතයින් වශයෙන් වර්තමාන රටේ තත්වය සැලකිල්ලට ගෙන ඉදිරි කටයුතු සිදු කළ යුතු ආකාරය තමන් මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන බව පවසන ලදී. ජනාධිපතිවරණයකදී 2/3 ක බහුතරයක් ලබා පත්වූ ජනාධිපතිවරයෙක් මහජනතාවගේ දැඩි විරෝධතාවය මත

ජනාධිපති ධූරයෙන් ඉල්ලා අස් වූ බවත් නමුත් දිස්ත්‍රික් ජනතා ඡන්ද තිස්පන්දාහක් වත් ලබා ගැනීමට නොහැකි වූ නුසුදුසු අයෙක් ජනාධිපති ලෙස කටයුතු කරන බවත් පවසන ලදි. ව්‍යවස්ථානුකූලව අද දිනයේ දී ජනාධිපති කෙනෙක් තෝරා පත්කර ගැනීම සඳහා පාර්ලිමේන්තුවේ දී නාමයෝජනා තුනක් ඉදිරිපත් වී ඇති බවත් එහිදී රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ නම දිනේෂ් ගුණවර්ධන මැතිතුමා යෝජනා කළ අතර මනුෂ නානායක්කාර මැතිතුමා එය ස්ථිර කල බවත්, ඩලස් අලහප්පෙරුම මැතිතුමාගේ නම සජිත් ප්‍රේමදාස මැතිතුමා යෝජනා කළ අතර ජී එල් පීරිස් මැතිතුමා එය ස්ථිර කල බවත් තම පක්ෂයෙන් අනුර කුමාර සහෝදරයා යෝජනා කළ බවත් ප්‍රකාශ කරන ලදී.

වර්තමාන රටේ ව්‍යසනය තුල ප්‍රධාන කොටස් කරුවෙක් වශයෙන් රනිල් වික්‍රමසිංහ මැතිතුමා පෙන්වා පෙන්වාදිය හැකි බවත්, එතුමන් 1976 දී මුලින්ම පාර්ලිමේන්තුවට පැමිණි අවස්ථාවේ සිටම මේ දක්වා කිසිදු රටට වැඩදායී යහපත් ක්‍රියාවක් සිදු නොකළ බවත්, එතුමන් මුලින්ම අධ්‍යාපන ඇමැතිවරයකු ලෙස පත්වී අධ්‍යාපනය විනාශ කිරීමට කටයුතු කළ බවත්, පසුව අගමැති ලෙස පත් වී එල් ටී ටී ඊ ත්‍රස්තවාදයට ගිවිසුම් ගත වී රටේ කොටසක් පැවරීමට සැරසුණු බවත් පැවසීය. එමෙන්ම මේ වර්තමානයේ පත් වූ කෙටි කාලසීමාව තුළ ද වරාය, විදුලිබල මණ්ඩලය, ගුවන් තොටුපළ හා අනෙකුත් ඉඩම් විකිණීමට අවශ්‍ය කටයුතු යොදා ඇති බවත්, එමනිසා මෙතුමන් ජනාධිපති වීමට නුසුදුසු බවත් පැවසීය. වර්තමාන මහජන මතය අනුව රනිල් වික්‍රමසිංහ මැතිතුමා ජනාධිපති වීම ජනතාව ප්‍රතික්ෂේප කරන බවත්, මීට පෙර මැතිවරණ වලදී රනිල් වික්‍රමසිංහ මැතිතුමා විජාතික බලවේග වලට රට විකුණන බව ප්‍රකාශ කළත් පොදුජන පෙරමුණෙන්ම වර්තමානයේ එතුමන්ව ආරක්ෂා කරමින් ජනාධිපති කරවීමට සූදානම් බවත් පැවසීය.

ලංකාවේ ගම්බද ජනතාවගේ ඡන්දයෙන් පත් වී පාර්ලිමේන්තුවට ගිය සමහර මන්ත්‍රීවරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා ජනාධිපති කරවීමට සැරසෙන බවත් , සමාජ මාධ්‍ය ජාලාවල පලවූ ලිපියකට අනුව එතුමන්ව ජනාධිපති කරවීමට කමිටුවක් ක්‍රියා කරන බවත්, එහි අනුරාධපුර නියෝජනය ෂෙහාන් සේමසිංහ මැතිතුමා නියෝජනය කරන බවත්, නමුත් තමා මෙම ලිපියේ නිර්වද්‍යතාවය පිළිබඳව නිශ්චිතව නොදනින බවත් පැවසීය.

රනිල් වික්‍රමසිංහ මැතිතුමා ජනාධිපති ලෙස හෙට දිනයේ දී පත්වුවහොත් ගැටලු රාශියක් සිදු වන බවත්, එතුමන් වැඩබලන ජනාධිපතිවරයා වශයෙන් පත්වූ විගසම බලය පාවිච්චි කළ බවත්, ත්‍රිවිධ හමුදාවට වෙඩි තැබීමට අණ කලත් ත්‍රිවිධ හමුදාව එය ප්‍රතික්ෂේප කළ බවත්, ඉන්පසු විවිධ කුමණ්ත්‍රන කල බවත් එම කුමණ්ත්‍රන ජ.වි.පෙ. ට හා පෙරටුගාමීන් වෙත යොමු කිරීමට උත්සාහ කල බවත් පැවසීය. රටේ හෙට දිනයේ යහපතක් සිදු කිරීමට අවශ්‍ය නම් පාර්ලිමේන්තුවේ වෙනසක් සිදුකළ යුතු බවත්, ඉදිරි මාස හයක් තුළ සෑදෙන සර්වපාක්ෂික ආණ්ඩුවක් මගින් ඉක්මන් මැතිවරණයකට ගොස් ජනතා ඡන්දයෙන් හොඳ ආණ්ඩුවක් පත්කර රට ස්ථාවර කළ හැකි බවත් ප්‍රකාශ කරන ලදී.

<u>ගරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරි මැතිනිය</u> ගෝඨාභය රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා 2/3 ක බලයක් ලබා ජනාධිපති වූ බවත්, එතුමන් මිරිහානේ තම නිවසේ ජනාධිපති වූ පසුවත් සිටි බවත්, මිරිහාන නිවස කැරලිකරුවන් විසින් විනාශ කිරීමෙන් අනතුරුව පමණක් ජනාධිපති මන්දිරයට ගිය නිසාවෙන් එතුමන් ට ගෞරවනීය ස්තුතිය පුද කරන බව පැවසීය. ඉන්පසුව ජනාධිපති මන්දිරය ද පෞද්ගලික දේපලක් ලෙස සිතා ඉතා අවිනීත ලෙස කැරලිකරුවන් පිරිසක් විසින් විනාශ කරන අයුරුත්, ජනාධිපති මන්දිරයේ අතීත තතු නොදැන අසත්‍ය තොරතුරු මුදා හැරිය බවත්, රටේ ජාතික කොඩිය අව භාවිතා කරමින් හැසිරෙමින් ජාත්‍යන්තරයට විහිලුවක් වූ බවත් පවසන ලදි.

එමෙන්ම ජූලි 9 වනදා සිදු වූ සිද්ධීන් අවශ්‍යතාවේදී අරගල කරුවන් විසින් ජනාධිපති මන්දිරයේ ගේට්ටු අසලට පැමිණෙන තෙක්ම ගෝඨාභය රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා ජනාධිපති මන්දිරය තුළ සිටි බවත්, ආරක්ෂක අංශ විසින් අරගල කරුවන් ගේ පැමිණීම මැඩ පැවැත්වීම උදෙසා වෙඩි තබන්නට ද යන්න විමසූ විට හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා එය වළක්වා පිටුපසින් පිටව ගොස් ඇති බවත්, ඒ ආකාරයෙන් සිංහල ජාතියට එක වෙඩිල්ලක් වත් නොතිබීම වෙනුවෙන් ස්තුතිවන්ත වන බවද ප්‍රකාශ කරන ලදී. ජනතාව විසින් රටේ පවතින වර්තමාන තත්ව හමුවේ අරගල කිරීම සාධාරණ බවත්, ජනතාවගේ පැත්තේ

තමා සිටින බවත් පවසන අතර විසඳුම් සෙවිය යුත්තේ ඒ ආකාරයේ විනාශකාරී ලෙස නොවන බව පවසන ලදී.එමෙන්ම ජූලි 9,වනදා අත්පත් කරගන්නා ලද එම මන්දිර අව භාවිතා නොකර අදාල රාජ්‍ය ආයතන වෙත භාරදුන්නේ නම් යහපත් බවත් ප්‍රකාශ කරන ලදී. සමාජ මාධ්‍ය ජාලා ඔස්සේ විවිධ පුද්ගලයින් විසින් බලපෑම් සිදු කරන බවත්, ඕනෑම අයෙකුට තම අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය ඇති බවත්, ඒ සඳහා බලපෑම් කල නොහැකි බවත් පැවසීය. ගරු කුමුදු මන්ත්‍රී තුමා හමුදාවට ප්‍රහාරය එල්ල කලේ ආණ්ඩු පක්ෂයේ පුද්ගලයින් ලෙස ප්‍රකාශ කළත් ඇත්ත වශයෙන්ම පාර්ලිමේන්තුව අසළ අරගලයක් සූදානම් කරමින් පාර්ලිමේන්තු හිටපු ගරු මන්ත්‍රී වන හඳුන්නෙත්ති මැතිතුමා හා පාර්ලිමේන්තු හිටපු ගරු මන්ත්‍රී ලාල්කාන්ත මැතිතුමන් විසින් එය මෙහෙයවමින් කටයුතු කළ බවත් පැවසීය. වර්තමානයේ මෙම ආර්ථික අර්බුදය සිදුවී ඇත්තේ ශ්‍රී ලංකාවට පමණක් නොව මුළු ලෝකයටම එය බලපා ඇති බවත්, කොරෝනා වසංගතය හමුවේ ලංකාවේ ආර්ථිකය කඩා වැටුණු බවත්, එම නිසා මෙම තත්ත්වය උදා වූ බවත් පැවසීය. අරගලය සාධාරණ වුවත් එහි නිසි ලෙස විනයක් පැවැතිය යුතු බවත්, සොරුන් ඇල්ලීම නිසි ලෙස සිදු කල යුතු අතර නිවෙස් ගිනි තබමින් එය සිදු නොකළ යුතු බවත්, අරගලයේ සිටින මිනිසුන් අතර ද සමගියත් නොමැති සේම සොරුන් ද සිටින බව පවසන ලදී. ඊළඟ ජනාධිපතිවරයා කවුරුන් වුව ද ප්‍රජාතන්ත්‍රවාදී මාවතකින් පැමිණිය යුතු බවත්, ඒ පිළිබඳව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හට ඡන්දය දිය යුත්තේ කාටදැයි යනුවෙන් බලපෑම් කිරීමට නොහැකි බවත් ප්‍රකාශ කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> වර්තමානයේ රටේ පවතින තත්වය හා මීට මාස කිහිපයකට ඉහතදී රටේ පැවති තත්වය පිළිබඳව විවිධ පුද්ගලයින් විසින් දේශපාලනික හා සමාජීය වශයෙන් විවිධාකාර විග්‍රහයන් ඉදිරිපත් කරන බවත්, 1948 න් පසුව 74 වසරක් තුලම දේශපාලනඥයින් විසින් රටට කිසිදු වැඩදායී දෙයක් නොකළ බවට අසත්‍ය ප්‍රචාර පතුරවමින් හා එම 74 වසර තුලම නැති වූ සියලු ජාතික ධනය පිළිබදව වගකීම එක් දේශපාලන පිරිසකට පමණක් යොමු කරමින් ජනතාව තුල වැරදි මතයක් ගොඩ නගා ඇති බවත් පැවසීය. එම ජාතික ධනය ආකාර කිහිපයකදී විනාශ වූ බවත්, එහිදී L.T.T.E ත්‍රස්තවාදය මගින් ද , 71 භීෂණය, 88 89 භීෂණය මගින් ද කොටස් වශයෙන් විනාශ වූ බව ප්‍රකාශ කරන ලදී. සෑම දේශපාලන පක්ෂයක්ම ආණ්ඩුවක් කරගෙන යෑම සඳහා හවුල් වී ඇති නිසාත් මන්ත්‍රී ධූර ඇමතිධූර දරා ඇති නිසාත් ජාතික ධනය විනාශ වීම සඳහා සෑම දේශපාලන පක්ෂයක්ම වගකිව යුතු බව ප්‍රකාශ කරන ලදී.

වර්තමාන ආර්ථික ගැටලු හමුවේ ජනතාව අරගල කිරීමට නැගී සිටීම සාධාරණ බවත් නමුත් ඒ සඳහා දේශපාලන පක්ෂ අතපෙවීමට යෑම සාධාරණ නොවන බවත් එම නිසා මෙම අරගලය දේශපාලනික මුහුණුවරක් ගෙන දියාරු වී ගොස් ඇති බවත් පැවසීය. දේශපාලන පක්ෂ වල වගකීම වන්නේ සමාජය සුබවාදී දිශාවලට ප්‍රගමනය කිරීම බවත්, වර්තමානයේ සමාජ, ආගම් හා ජාතීන් ලෙස ආගාධයකට ඇද දමා ඇති බවත් , එය රටට පැවැත්මක් නැති බවත්, රටේ අනාගතයට එය අවාසනාවන්ත තත්ත්වයක් බවත් පැවසීය.

ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ අතීතය පිළිබඳව බොහෝ දේවල් ගරු කුමුදු ප්‍රියන්ත මැතිතුමා ප්‍රකාශ කළ බවත්, කළ සේවාවන් බොහොමයක් පවතින බවත්, එහිදී විද්‍යාපීඨ සංකල්පය ඇති කිරීම, සෞන්දර්ය විශ්ව විද්‍යාල ඇති කිරීම, රූපවාහිනී ගම්මාන ඇති කිරීම, තරුණ සේවා සභාව ඇති කිරීම, කර්මාන්තය ලෙස කටුනායක හා බියගම ඇති කල බවත් ප්‍රකාශ කරන ලදි . වර්තමානයේ දී එතුමන් පාර්ලිමේන්තු මැතිවරණයෙන් පරාජය වුවත් පක්ෂයට ලැබුණු මුළු ඡන්ද ප්‍රමාණය පදනම් කරගෙන පක්ෂ මහ ලේකම් ගේ අනුමැතියට යටත්ව ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා ජාතික ලැයිස්තුව යටතේ ව්‍යවස්ථානුකූලව පාර්ලිමේන්තු මන්ත්‍රී ධූරයක් ලබා ගත් බවත්, එතුමන් ද පාර්ලිමේන්තුවේ සිටින මන්ත්‍රීවරුන් 225න් එක් අයෙක් බවත් එමනිසා හිටපු ජනාධිපති අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා වර්තමාන ගැටලුකාරී තත්ත්වය හමුවේ, අගමැති තනතුර භාරගන්නා ලෙසට සියලුම පක්ෂවලට ආරාධනා කළ අවස්ථාවේදී එතුමා ආසනයක් රහිතව සිටියත් ඉතා නිර්භීතව අගමැතිකම භාරගත් බවත් ප්‍රකාශ කරන ලදී. ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ විශාල පුස්තකාලයක් සහිත ව පැවති නිවස කොළඹ රාජකීය විද්‍යාලයට පවරා තිබියදීත් අරගලකරුවන් විසින් ඉතා විනාශකාරී ලෙස ගිනි තබන ලද බවත්, ජනාධිපති තනතුර සඳහා අද දින නාමයෝජනා ඉදිරිපත් වූ අපේක්ෂකයන් තිදෙනාගෙන් කිසි අයෙක් විවේචනය නොකරන බවත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සුදුසු අයෙක් ජනාධිපති ලෙස තෝරාපත් කල විට එතුමන්ට සහය පල කරමින් මේ රටේ ඉදිරි කටයුතු සිදු කිරීමට සූදානම් බවත්, ජනාධිපති වරයෙක් පත් වීමටත් පෙර සිටම වෘත්තිය සමිති

වර්ජන සිදු කල බවත්, අරගලකරුවන්ට අත්පත් කරගත් මන්දිර වලට ඇතුලු නොවී ඒවායේ ගේට්ටු අභියස සිටින්නට හැකි වූවානම් යහපත් බවත්, ආරක්ෂක අංශ වෙඩි නොතබා දැඩි ඉවසීමෙන් ක්‍රියාකල නිසා ඔවුන්ට ගරු කල යුතු බවත් පැවසීය. අවසන් වශයෙන් සියලුම දේශපාලන පක්ෂ වලින් තම තමන්ගේ වගකීම ඉටු කරමින්, පාට පක්ෂ භේද වලින් තොරව මේ රට ගොඩ ගත යුතුයි යනුවෙන් ඉල්ලීමක්ද කරන ලදි.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා ප්‍රාදේශීය සභාවක් ලෙස මෙහි සිටින මන්ත්‍රී වරුන් තම තමන්ගේ දැනීමට අනුව හා තම තමන් නියෝජනය කරන දේශපාලන පක්ෂවලට අනුව අදහස් ප්‍රකාශ කල බවත්,අරගල වලින් රටවල පාලනය වෙනස් කල රටවල් තිබෙන බවත්, ප්‍රංශ විප්ලවය හොද උදාහරණයක් බවත් , ගෝතමාලාව හා ඊජිප්තුව වැනි රටවලද අරගල කර ඊජිප්තුව ගොඩ ගියත් ගෝතමාලාවට අරගල තුලින් තම අරමුණු ඉටු කරගත නොහැකි වූ බවත් පවසන ලදි. 1948 සිටම රටේ පාලනයේ දුර්වලතා පැවති බවත්, ඒ කාලයේදී භාණ්ඩාගාරයේ පැවති අතිරික්තයෙන් නොමිලේ සහල් බෙදා දී වරදක් කල බවත් නමුත් ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ පාලන සමයේදී දේශීය ආර්ථියට මුල් තැන දී අතිරික්තයක් ඉතිරි වූ බවත්, නමුත් ගරු ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ කාලයේ විවෘත ආර්ථිකය හදුන්වා දී රටට විනාශයක් වූ බවත් එය වර්තමානය දක්වා පවතින බවත් පැවසීය. 88/89 භීෂණ සමයේ විපක්ෂයෙ පෙනී සිටින්න කිසිදු අයෙක් නොමැති විට මාධ්‍යවේදීන් 4ක් පෙනී සිටි බවත් ඔවුන් නම්, හිරු පුවත්පතේ විමලසිරි ගම්ලත් මහතා, ඩලස් අලහප්පෙරුම මැතිතුමා, සුනිල් මාධව ප්‍රේමතිලක මහතා හා විනී හෙට්ටිගොඩ මහතා යන අය බවත්, ඔවුන් එදා රටට මහත් සේවයක් කල බවත් පැවසීය. ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපති වූ පසු රටේ ප්‍රශ්න විසදයි යනුවෙන් විශ්වාස කල බවත්, නමුත් එය ඉටු නොවුනු බවත්, ගොවියන්ට පොහොර නොමැති වීම නිසා ගොවියන් පාරට බැස ජනතාවගේ විස්වාසය බිද වැටුනු බවත් පැවසීය. ගරු හිටපු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා ද හොද දැක්මක් සහිත නායකයෙක් බවත්, එතුමාගෙ දැක්ම යටතේ ගරු නාමල් රාජපක්ෂ මැතිතුමා "කුඩා පක්ෂ වලට මහ ගස් පෙරලන්න බෑ නමුත් මුල් බුරුල් කරන්න පුලුවන් " යනුවෙන් වැදගත් කියමනක් ප්‍රකාශ කළ බවත්, නමුත් ගරු ශෙහාන් සේමසිංහ මැතිතුමා වැනි අය කුඩා පක්ෂ අවශ්‍ය නොවන බව පැවසූ බවත්, ගරු විමල් වීරවංශ මැතිතුමන්ව මාර්තු මාසයේ එලියට දැමූ පසු අප්‍රේල් 9 ගෝඨාගෝගම සැදුනු බවත්, ඉන් පසුවත් ජනතාවගේ කැමැත්ත නොතකා කටයුතු කල නිසා ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාටත් ජනතා අප්‍රසාදය පල වී ඉවත්ව යැමට සිදු වූ බවත්, ඉන් පසුවද ජනතා මතය නොතකා ක්‍රියා කල නිසා ගරු හිටපු ජනාධිපති ගෝටාභය රාජපක්ෂ මැතිතුමාට ද ඉවත් වීමට සිදු වූ බවත්, ඉන් පසුව ජනාධිපති කිරීමට සැරසෙන ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාටත් ජනතාවගේ අප්‍රසාදය ඇති බවත් ප්‍රකාශ කරන ලදී. එමනිසා නූපන් පරපුරක් වෙනුවෙන් සියලු දෙනාම එක් වී රට ආරක්ෂා කලයුතු බවත්, සර්වපාක්ෂික හෝ අන්තර්කාලීන ආණ්ඩුවක් පිහිටුවා රටේ ඉදිරි කටයුතු සිදුකල යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී පී.ටී.සිරිසේන මැතිතුමා නව වනදා සිදු වීමත් සමග ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ටද අවදානමක් පවතින බවත්, මෙම අරගලකරුවන් බලපොරොත්තු වන්නේ තම තමාගේ පෞද්ගලික අභිමතාර්ථ ඉටුකර ගැනීම බවත්, එක්තරා අවස්ථාවකදී දමිතා නම් ජනප්‍රිය නිළිය අරගල භූමියේ දී " ගොවියන් අරගලයට නොපැමිණෙන්නේ නම් ඔවුන්ගේ වගාවන්ට ගිනි තැබිය යුතු බවත් එවිට ගොවියන් අරගලයට පැමිණේවි" යනුවෙන් නොගැලපෙන ප්‍රකාශයක් ප්‍රකාශ කළ බවත් පැවසීය.

මෙම ආර්ථික අර්බුදයක් ඇති වූයේ හිටපු ජනාධිපති අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ වරදින් නොවන බවත්, එතුමන් ජනාධිපති වී මාස තුනක් යන විටම පැමිණි කොරෝනා වසංගත තත්ත්වයත් සමග බවත්, සමහරුන් අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ප්‍රජාතන්ත්‍රවාදී නායකයෙක් නොවන බව පැවසුවත් එතුමන් වගේ ප්‍රජාතන්ත්‍රවාදී නායකයෙකු මීට පෙර සිට නොමැති බවත් එදා එතුමන් සිටින ජනාධිපතිමන්දිරයට අරගලකරුවන් කඩා වදින විට එතුමන්ට බලය පාවිච්චි කල හැකි වුවත් බලය පාවිච්චි නොකර එතුමන් එදා පිටව ගිය බවත් පැවසීය. හිටපු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා අග්‍රාමාත්‍ය ධූරයෙන් ඉවත් වූ පසු අතිගරු ගෝඨාභය රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා විසින් අග්‍රමාත්‍ය ධූරය භාරගැනීම සඳහා සියලුම පක්ෂවලට ආරාධනා කළ නමුත් එය භාර ගැනීමට පැමිණියේ ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා පමණි. එතුමන් අග්‍රාමාත්‍ය වී තවම මාස එකහමාරක් පමණක් වන අතර එතුමන්ට මේ තත්ත්වයෙන් රට ගොඩ ගැනීම සඳහා අවම මාස හයක කාලයක් වත් ලබා දිය යුතු බවත්, ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා අත්දැකීම් බහුල නායකයෙක් නිසාත් සියලුම දෙනා එක්වී එතුමන්ට සහය දිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී. මේ වන

විටත් එතුමන් ගේ පාලනය යටතේ, අකණ්ඩව ගෑස් පැමිණෙන බවත්, පොහොර ගෙන්වා ඇති බවත්, ඉන්ධන ලබා දීමේ වැඩපිළිවෙළක් සකසා ඇති බවත් ද ප්‍රකාශ කරන ලදී. එමෙන්ම ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා වර්ථමානයේ ජනාධිපති ධූරය සඳහා සුදුසු බවත් එතුමන්ට ප්‍රාදේශීය සභාවක් ලෙස අපි සියලු දෙනාම සහය දිය යුතු බවත් ප්‍රකාශ කරන ලදි.

__ගරු සභාපති එස්. බී කුමාරදාස මැතිතුමා__ ප්‍රදේශයේ ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා තීන්දු තීරණ ගැනීම වෙනුවෙන් ගෞරවයෙන් සහයෝගය දැක්වූ ගරු මන්ත්‍රීතුමන්ලා වෙත හා ගරු මන්ත්‍රීතුමියන්ලා වෙත ස්තූතිය ප්‍රකාශ කරන ලදි. අරගලකරුවන් සාධාරණ බවත් , අරගලය මුලින්ම ආරම්භ වූයේ ගොවීන්ගේ යූරියා පොහොර ගෙන්වීම නවතා දැමීම මගින් බවත් නමුත් පසුකාලීනව මෙම අරගලය මිනිසුන්ගේ දෛනික අවශ්‍යතා ඉටුකර ගැනීමේ අපහසුතාව මූලික නොකර වාමාංශික අදහස් වලින් පිරි දේශපාලන ගැති ස්වරූපයක් ගෙන ඇති බවත් පැවසීය. හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා බලයට පැමිණෙන අවස්ථාවේදී එතුමාට අමානුෂීය චෝදනා එල්ල වුවත් අරගල අවස්ථාවේදී එතුමන් දැඩි ප්‍රජාතන්ත්‍රවාදී ආකාරයෙන් ක්‍රියා කළ බවත් එතුමන්ගේ එම දැඩි ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාකලාපය නිසාම වර්තමානයේ ධූරයෙන් ඉවත්වීමට සිදුවූ බවත් පවසන ලදී. රටේ ඉදිරි පාලනය සම්බන්ධයෙන් තීන්දු තීරණ ගැනීම සඳහා ජනතා ඡන්දයෙන් පත් කර යැවූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සිටින බවත් ඒ සඳහා එතුමන්ලාට බලපෑම් කිරීමට නොහැකි බවත් පවසමින් 2022.07.19 වන දින පැවැත්වූ මහ සභා රැස්වීම ප.ව 12.30 ට අවසන් කරන ලද අතර එළඹෙන මහ සභාව 2022.08.19 වන දින පෙ.ව 10.00 පැවැත්වෙන බව සඳහන් කරන ලදී.

....................................

ලේකම්,
නෑ. නු. ප ප්‍රාදේශීය සභාව,
විජයපුර.

..........................................

එස්. බී කුමාරදාස,
සභාපති ,
නෑ. නු. ප්‍රාදේශීය සභාව,
විජයපුර.